**මාතලේ ප්‍රාදේශීය සභාව**
**මාතලේ දිස්ත්‍රික්කය**
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 28 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 25 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 27 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය
----------

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මාතලේ ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ). ගොඩනැගිලි විෂයයන් 10ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ). රු.430,000ක් වටිනා අල්මාරියක් මිලදී ගැනීම සඳහා ගෙවා තිබුණු රු.100,000ක අත්තිකාරම් මුදල ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ). (i). නිව්සිටි ඇල්ලේපොල එස්ටේට් ඉඩමේ වටිනාකම රු.100,000ක් වූ පර්චස් 15ක් සහ අක්කර 04 රූඩ් 03 පර්චස් 16ක් විශාල වූ ඉඩම් කට්ටි 08ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ii). වටිනාකම රු.60,000 ක් වූ ඇටඹගහයාය ඉඩමේ පර්චස් 07ක කොටසක් 2008 වර්ෂයේදී තෑගි ඔප්පුවකින් පවරාදී තිබුණද, එහි වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ). රු.2,384,399ක් වූ ණයහිමි ශේෂ සහ පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.10,385ක් වූ දායක මුදල ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඊ). ජල බවුසර් කුලියට දීමෙන් ලැබිය යුතු රු.348,625ක ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ලැබිය යුතු ගිණුම්

---------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක එකතුව රු.31,014,876ක් වූ අතර, ඊට වසරක කාලයක් ඉක්මවූ වූ රු.15,698,874 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ආ). ගෙවිය යුතු ගිණුම්

---------------------

2013 දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමි ශේෂය රු.25,113,989ක් වූ අතර, ඊට වසරක කාලයක් ඉක්මවූ රු.10,661,650ක් ක ශේෂ ඇතුළත්ව තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.34,552,978ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ). | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 132 වගන්තිය | යොමුගත විධිවිධානවලින් ඉඩ සලසාදී නොමැති කාර්යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 25කදී රු.162,929ක් වැයකර තිබුණි. |
| (ආ). | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 371(2) රෙගුලාසිය | ඉකුත් වර්ෂවලදී ලබාදී තිබුණු අත්තිකාරම් වලින් රු.310,367ක ශේෂයක් නිරවුල් කර නොතිබුණි. |
| (ඇ). | මධ්‍යම පළාත් සහා පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ | |
| | (i). 2013 මාර්තු 23 දිනැති අංක 3/2/2/4 දරන චක්‍රලේඛය | අනුමත සීමාව ඉක්මවා මසකට රු.1000 බැගින් දුරකථන වියදම් ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී මාස 10 ක කාලයක් සඳහා රු.150,000ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ii). 2013 අප්‍රේල් 05 දිනැති අංක 01/2013 දරන චක්‍රලේඛය | දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකරන ලද මන්ත්‍රීවරුන් 15 දෙනෙකුට රු.212,500ක ඉන්ධන දීමනා ගෙවා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,241,697ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,312,198ක් විය. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,070,501 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
---------------------------------------

ක්‍රියාත්මක තත්ත්වයේ පැවති ජල ව්‍යාපෘති 16න් ව්‍යාපෘති 02ක ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය පිළිවෙලින් සියයට 10 හා සියයට 55 මට්ටමක පැවති අතර, තවත් ව්‍යාපෘති 13ක හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 0 සිට සියයට 69අතර පරාසයක පැවතුණි.

2.2.2 වරිපනම්
-----------

සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම් වලින් රු.220,554ක් හා ඉකුත් වර්ෂවලට අදාළ හිඟ වරිපනම් වලින් රු.94,467ක් වශයෙන් එකතුව රු.315,021ක මුදලක් අයවීමට තිබුණි.

2.2.3 වෙනත් ආදායම්
--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට බිම් කුලී සහ කඩකාමර ඉදිකිරීම වෙනුවෙන් වූ ඇස්තමේන්තු ගාස්තු වශයෙන් එකතුව රු.1,875,000ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 653,501 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.9,205,076 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

2.3 අධිභාර
---------

ඉකුත් වර්ෂවලදී හා සමාලෝචිත වර්ෂය තුළ පනවන ලද අධිභාරවලට අදාලව 2013 දෙසැම්බර් 31 දිනට රු.1,737,060ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ). ඉකුත් වර්ෂ දෙකේදී හා සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගොඩනැඟිලි අයදුම්පත්වලින් 700කට අනුමැතිය ලබාදී තිබුණු නමුත්, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව අනුකූලතා සහතික ලබාදී තිබුණේ අයදුම්පත් 63ක් සඳහා පමණි.

(ආ). විශ්‍රාම ගිය හා සේවය හැර ගිය නිලධාරීන් 10දෙනෙකුගෙන් රු.119,192ක හිඟ ණය ශේෂ අයවීමට තිබුණි.

(ඇ). විධිමත් පරිදි මිල ගණන් කැඳවීමකින් තොරව කුලියට ලබාගත් වාහන 02ක් සඳහා රු.335,000ක කුලි මුදල් ගෙවා තිබුණි.

(ඈ). බලපත්‍ර නිකුත් කළයුතු වෙළඳසැල් 206ක් හඳුනාගෙන ගාස්තු අයකරගෙන තිබුණද බලපත්‍ර නිකුත් කර තිබුණේ ඉන් වෙළඳසැල් 79ක් සඳහා පමණි. ඉතිරි වෙළෙඳසැල් 127ක බලපත්‍ර නොමැතිව ව්‍යාපාර කටයුතු කර තිබුණි.

3.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පිරිවැය රු.33,500ක්වූ ශබ්දවාහිනී කට්ටලයක් හා වටිනාකම ගණනය නොකළ භාණ්ඩ විෂයයන් 15ක් නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවතුණි.

3.3 හඳුනාගත් අලාභ

--------------------

1993 අංක 18 දරන පනතින් සංශෝධිත 1980 අංක 46 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව දායක මුදල් නොයැවීම නිසා ඉකුත් වර්ෂ 03ට අදාලව සභා අරමුදලින් රු.10,388ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

මහනැගුම ප්‍රතිපාදන යටතේ මාර්ග 03ක කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරිමේ කර්මාන්ත 03ක් පිළිබද භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| කර්මාන්තයේ නම | ඇස්තමේන්තු කළ මුදල | නිරීක්ෂණ |
|---|---|---|
| | රු. | |
| (i).බීරිදෙවොල ජනපදයට පිවිසුම් මාර්ගය - පළමු අදියර | 500,000 | පාරේ දිගින් මීටර් 17ක කොටසක කුට්ටිගල් ගිලාබැස තිබූ අතර, ඒ සඳහා රු.45,860ක වියදමක් දරා තිබුණි. |
| (ii).අළුවිහාරේ සේරුගල පිවිසුම් | 500,000 | වර්ග මීටර් 237.86ක් සඳහා ගෙවීම් කළයුතු වුවත්, වර්ග මීටර් 243.01 කට |

| | | |
|---|---|---|
| මාර්ගය | | ගෙවීම් කිරීම් නිසා රු.14,090ක වැඩිපුර ගෙවීම් සිදු වි තිබුණි. |
| (iii).අළුවිහාරේ පිවිතුරු මාවත - දෙවන පටුමඟ පළමු අදියර | 500,000 | වර්ග මීටර් 239ක් සඳහා ගෙවීම් කළයුතු වුවත්, වර්ග මීටර් 243ක් සඳහා ගෙවීම් කිරීම නිසා රු.8,228ක් වැඩිපුර ගෙවීම් සිදු වි තිබුණි. |

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
-----------------------------------

සභා කොම්පෝස්ට් අංගනයේදී දෛනිකව කොම්පෝස්ට් කි.ග්‍රෑ.20ත් ග්‍රෑ.25ත් අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කරනු ලබන අතර, කි.ග්‍රෑ.01ක් රු.10ක මිලකට අලෙවි කළද, නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධ නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය
-----------------------------------------

4.1 අයවැය පාලනය
--------------------

අයවැය ලේඛනය මගින් වැය විෂයයන් 37ක් සඳහා සලසාදී තිබූ රු.8,276,000ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා වෙනත් වැය විෂයයන්ට මාරුකිරීම් හා ඉතිරි කිරීම් සිදුකර තිබුණි. ආදායම් විෂයයන් 02ක අයවැයගත රු.350,000ක ආදායම්වලින් කිසිදු මුදලක් උපයා ගෙන නොතිබුණු අතර, තවත් ආදායම් විෂයයන් 08ක ආදායම් ඉපයීමේ ප්‍රතිශතය සියයට 2 සිට සියයට 30 දක්වා පහළ මට්ටමක පැවතුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ). හිඟ ආදායම් අයකර ගැනීම.
(ආ). අයවැය පාලනය.
(ඇ). වත්කම් කළමනාකරණය.
(ඈ). ණයගැති හා ණයහිමි පාලනය.
(ඉ). ගබඩා පාලනය.
(ඊ). මූල්‍ය පාලනය.